# රජයේ වාරිමාර්ග වැඩ සටහන පිළිබඳව වාරිමාර්ග රාජ්‍ය ඇමති ගරු සරත් වෙලගෙදර මැතිතුමා සමග කරන ලද සාකච්ඡාවක්

**ප්‍රශ්නය:-**

අප රටේ වාරිමාර්ග සංවර්ධනය සඳහා ඔබ අමාත්‍යාංශය අනුගමනය කරන ප්‍රධාන උපාය මාර්ග මොනවා ද?

**පිළිතුර :-**

මෙහි දී ප්‍රධාන වශයෙන් ජල කළමනාකරණය විධිමත් කිරීම සහ වාරිමාර්ග පද්ධති පිළිසකර කිරීම තුලින් උපරිම වශයෙන් ජලයෙන් ප්‍රයෝජන ගැනීමට අවධානය යොමුව පවතිනවා. මීට අමතරව ගොවි සංවිධාන ශක්තිමත් කර ඒ මගින් ජලය ඉතාමත් ඵලදයී ලෙස භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු යොදනවා

**ප්‍රශ්නය :-**

රජය මගින් ආරම්භ කිරීමට අපේක්ෂිත නව වාරිමාර්ග යෝජනා ක්‍රම මොනවා ද?

**පිළිතුර :-**

දැනට අනාගත වැඩ පිළිවෙලවල් කිහිපයක්ම තියෙනවා. ඒවායින් සමහරක් නම්. යාං ඔය හරස්කර බඳින වේල්ලක් මගින් පදවිය ජනපදයේ ඇති ජල ප්‍රශ්ණයට විසඳුමක් ලබාදීම සහ අලුත් ප්‍රදේශයක් සංවර්ධනය කිරීම උමා ඔය ජලය දකුණට ගෙන යාම මගින් කිරිදි ඔය ව්‍යාපාරයෙන් පෝෂිත කරනු ලබන ලුණුගම් වෙහෙර ජලාශයට ජලය ලබා දී ඒ මගින් එහි දැනට ඇති ජල ප්‍රශ්නය විසඳීම සහ දැනට ප්‍රධාන වශයෙන් ජල ප්‍රශ්නය නිසා නොදියුණු තත්ත්වයේ ඇති ගිණිකොන වියළි ප්‍රදේශය (SEDZ) සංවර්ධනය කිරීම, ලග්ගල පිහිටි කළු ගඟ හරහා වේල්ලක් බැඳ පොළොන්නරු දිස්ත්‍රික්කයේ ඇති ජල ප්‍රශ්නය විසඳිම සහ එමගින් එම ප්‍රදේශය සංවර්ධනය කිරීම. මෙනිසා ඉතිරිවන ජලය පොල්ගොල්ලෙන් බෝවතැන්න වෙත උමගයක් මගින් දඹුලු ඔය හරහා මී ඔය වෙත යැවීම මගින් වයඹ පළාතේ මී ඔය මිටියාවත සංවර්ධනය කිරීම සහ මහවැලි "එච්" කලාපයේ සහ මහවැලි ජලය ලබන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති ව්‍යාපාර වල ජල ප්‍රශ්නය විසඳිම ආදියයි.

**ප්‍රශ්නය:-**

රජයේ වාරිමාර්ග ප්‍රතිපත්තිය අනුව ගොවි සංවිධානවලට විශාල කාර්යභාරයක් පැවරී ඇති බව පෙනේ. මේ සම්බන්ධව ඔබේ අදහස් පැහැදිලි කරන්න.

**පිළිතුර :-**

මෙය ඉතා හොඳ ක්‍රමයක්. එමගින් ගොවීන්ගේ අවශ්‍යතාවය හා සහභාගීත්වය ඇතිව කටයුතු කළ හැකි වෙනවා. ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය (NIRP) යටතේ ව්‍යාපෘති වියදමින් 10% ක් වටිනා වැඩ කොටසක් ගොවීන් විසින් කිරීමේ හේතුවෙන් එම ව්‍යාපෘතිය තමන්ගේ යන අදහස ගොවීන්ට ඇතිවෙනවා. එබැවින් එය විනාශ නොවී ආරක්ෂා කර ගැනීමට පෙළඹෙනවා. මෙම ක්‍රමයේ දී බෙදුම් ඇලවල් යටතේ ඇති වාරිමාර්ග නඩත්තු හා මෙහෙයුම් කටයුතු ද ගොවීන්ට ම පැවරීමට අදහස් කරනවා. තව ද ගොවි සංවිධාන තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් වාරිමාර්ග ආඥා පනත ද සංශෝධනය කිරීමට පියවර ගෙන තිබෙනවා.

**ප්‍රශ්නය:-**

නඩත්තු හා මෙහෙයුම් කටයුතු ගොවි සංවිධාන වලට පැවරිය හැකි මට්ටමට ගොවි සංවිධාන දියුණු වී ඇතැයි ඔබ සිතන්නේ ද?

**පිළිතුර :-**

පොළොන්නරුව වැනි සමහර ප්‍රදේශවල ගොවි සංවිධාන ඉතා ශක්තිමත්ව පවතිනවා. එවැනි සංවිධානවල සාමාජිකයින්ට ජල පාලනය පිළිබඳව නිලධාරීන් හා සම කළහැකි දැනුමක් තියෙනවා. නමුත් සමහර සංවිධාන තවදුරටත් දියුනු කළ යුතු යි. පෞද්ගලික පරමාර්ථ ඉවත ලා පොදු දියුණුවට කටයුතු කරයි නම් ගොවි සංවිධාන ක්‍රමය වඩාත් සාර්ථක වෙනවා. ගොවි සංවිධාන, තම ව්‍යාපෘතියට සම්බන්ධ ඉදිකිරීම් කොන්ත්‍රාත් කිරීමට භාර ගන්නා විට මුළු වියදමින් 20% ක් ආරම්භකව ලබා දීමට රජය කටයුතු කර තිබෙනවා. නමුත් සමහර ගොවි සංවිධාන මගින් ලබා ගත්තේ යැයි කියන ඉදිකිරීම් කොන්ත්‍රාත්තු යළි බාහිර කොන්ත්‍රාත්කරුවන්ටදී ඇති බවත්, සොයා ගැනීමට හැකිවී තිබෙනවා. මේ පිළිබඳව තොරතුරු ගොවි සංවිධාන සාමාජිකත්වය පවා නොදනී. ගොවි සංවිධාන සවිමත් කිරීම තුලින් මෙවැනි තත්ත්වයන් නැති කිරීමට දැනට කටයුතු යොදා ගෙන යනවා.

**ප්‍රශ්නය :-**

නව වාරිමාර්ග යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම වියළි කලාපයේ ජල හිඟයට එකම විසඳුම යයි ඔබ සිතනවාද?

**පිළිතුර :-**

නැත, පවතින වාරිමාර්ග ව්‍යාපාර වලින් උපරිම ප්‍රයෝජන ගත යුතු යි. ගොවි සංවිධාන මගින් ජලය නිසි ලෙස පාලනය කොට ඵලදායීතාව වැඩි කළ යුතු යි. ජල නාස්තිය අඩු කළ යුතු යි.

**ප්‍රශ්නය :-**

වියළි කලාපයේ ජල හිඟයට ඔබ යෝජනා කරන විකල්ප වාරිමාර්ග ක්‍රම මොනවා ද?

**පිළිතුර :-**

කෘෂි ළිං ඇතිකිරීම හා පවතින

වාරිමාර්ග පුනරුත්ථාපනය මෙයට තරමක විසඳුමක් සේ ගත හැකියි. නමුත් සැලසුමකින් තොරව කෘෂි ළිං හැදුවොත් භූගත ජල මටට්ටම කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවිය හැකියි. මෙම කෘෂි ළිං භාවිතයෙන් අතුරු බෝග වගාව සිදු කළහැකි අතර, එයට ගොවීන් දැනුවත් කළ යුතු යි.

**ප්‍රශ්නයː-**

මධ්‍යම රජයේ බලය විමධ්‍යගත කිරීම යටතේ පළාත් සභාවලට හා මධ්‍යම රජයට අයිති වාරිමාර්ග පද්ධති පරිපාලනයේ ගැටළු මතු වී තිබේ ද?

**පිළිතුරː-**

සමහර පළාත්වල මුලින් වාරිමාර්ග කාර්යාල, උපකරණ හා නිලධාරීන් අවශ්‍ය තරම් සිටි අතර, පළාත් සභා වලට පවරා දීමෙන් පසු මධ්‍යම රජයට එම සම්පත් භාවිතයට ගැනීමට අපහසු වීම තරමක දුෂ්කරතාවයක් වී තිබුනා. නමුත් දැන් එම ගැටළු ක්‍රමයෙන් විසඳෙමින් පවතිනවා.

**ප්‍රශ්නයː-**

මෙවර "ගොවි දින" පැවැත්වෙන වයඹ පළාතේ වාරි කර්මාන්තය දියුණු කිරීම සඳහා ඔබ අමාත්‍යංශයෙන් කෙරෙන විශේෂ වැඩ පිළිවෙලවල් මොනවා ද? මේ පිළිබඳ විස්තරයක් අපි ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා.

**පිළිතුර ː-**

දැනට වයඹ පළාතේ වාරිමාර්ග ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. ඒවා,

1. වාරිමාර්ග පද්ධති කළමනාකරණ ව්‍යාපෘතිය (ISMP)
2. ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය (NIRP)
3. ජාත්‍යන්තර ආහාර හා කෘෂිකර්ම ආයතනයේ ආධාර මත ක්‍රියාත්මක වන වයඹ වියළි කලාපීය සහභාගීත්ව සංවර්ධන ව්‍යාපෘතිය
4. ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ වයඹ පළාතේ ක්‍රියාත්මක වන ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ADBP)
5. යුරෝපා ආර්ථික හවුලේ ආධාර යටතේ වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග යෝජනා ක්‍රමය (EECP)
6. ජාත්‍යන්තර කෙයාර් ආයතනයේ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය (CARE)

**ප්‍රශ්නයː-**

මෙම එක් එක් වාරිමාර්ග ව්‍යාපෘති සඳහා වැයවන මුදල කොපමණ ද, එයින් වයඹ පලාත තුල කවර භූමි ප්‍රමාණයක් වගා කිරීමට අපේක්ෂා කරන්නේද? එමගින් ඵල ලබන පවුල් සංඛ්‍යාව කෙතෙක්ද?

**පිළිතුර ː-**

මෙම වාරිමාර්ග යෝජනා ක්‍රම වලින් සමහරක ශක්‍යතා අධ්‍යයන තවම අවසන් කර නැත. ශක්‍යතා අධ්‍යයනය අවසන් කර ඇති ව්‍යාපෘති මගින් පහත සංඛ්‍යා ලේඛන දක්වමි. වාරිමාර්ග පද්ධති කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 1992 සහ 1993 වර්ෂය තුළ දී රුපියල් මිලියන 25.3 ක් වියදම් කර අක්කර 1400 ක් අලුතින් වගා කිරීමටත් එමගින් පවුල් 2500 කට සෙත සැලසීමටත් අපේක්ෂිතය.

ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය මගින් 1993 වර්ෂය සඳහා රුපියල් මිලියන 20 ක් වැය කෙරෙන අතර, හෙක්ටයාර් 700 ක පමණ කුඹුරු ඉඩම්වලට ජලය සැපයීමට අදහස් කෙරේ.

ජාත්‍යන්තර කෙයාර් ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියේ ග්‍රාමීය ජලාශ 35 ක් ගැඹුරු කිරීමට රුපියල් මිලියන 16 ක් යොදවා ඇත.

වයඹ වියළි කලාපීය සහභාගීත්ව සංවර්ධන ව්‍යාපෘතියේ ජල සම්පත් සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 150 ක් වැය කරමින් ඉඩම් අක්කර 5500 ක ජලය සපයමින් ගොවි පවුල් 7000 කට සෙත සලසනු ඇත.

වයඹ පළාතේ ක්‍රියාත්මක වන ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය මගින් අක්කර 750 ක් අලුතින් ම වගා කිරීමට වාරිකරණය කිරීමත්, මුළුමනින්ම අක්කර 46500 කට ජල සම්පාදනය කිරීමත් හා ගොවි පවුල් 11,500 කට සෙත සැලසෙන අයුරින් 1993-98 කාලය තුළ රුපියල් මිලියන 1140 ක් යෙදවීමට අපේක්ෂිත ය.

වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග යෝජනා ක්‍රම මගින් අක්කර 5955 කට ජලය සපයමින් පවුල් 2444 කට සෙත සැලසීමට රුපියල් මිලියන 307.44 ක් යෙදවීමට අපේක්ෂිත ය.

**ප්‍රශ්නය ː-**

සමස්තයක් ලෙස ගත්විට මෙම වයඹ පළාත තුළ ක්‍රියාත්මක වන වාරිමාර්ග සංවර්ධන කටයුතු පිළිබඳ ඔබේ අදහස කුමක් ද?

**පිළිතුරː-**

මෙම කටයුතුවල දී යෝජනාව එන්නේ නිලධාරියාගෙන් නොව ගොවි සංවිධාන හරහා ගොවියා ගෙන් බැවින් එය ගොවියාට වඩාත් ඵලදායී වනු ඇත. මෙම වාරිමාර්ග සංවර්ධන ව්‍යාපාර යටතේ උස්සාන වාරිමාර්ග, නළ ළිං සහ මධ්‍ය සහ කුඩා ප්‍රමාණයේ වැව් දියුණු කිරීමට අපේක්ෂා කෙරේ, ක්‍රියාත්මක වැඩ පිළිවෙල තුළින් සැලකිය යුතු සාර්ථකත්වයක් අත්කරගෙන තිබේ.

සාකච්ඡා කළේː
ජී. එම්. හේනෙගෙදර
ඩබ්. එම්. ජී. බී. ගිරාගම